# ඔබගේ නිවසෙහි කණ්ඩාංක (Coordinates) සොයාගත හැකි ආකාරය පිළිබඳව උපදෙස් පත්‍රිකාව

<table>
<tr>
<td>

හැඳින්වීම

මෙම උපදෙස් පත්‍රිකාව ඔබගේ නිවස ඇති ස්ථානයෙහි කණ්ඩාංක (Coordinates) Google Maps යෙදුම ආධාරයෙන් ලබාගන්නා ආකාරය විස්තර කරනු ලබයි.

- Google Maps යෙදුම විවෘත කරන්න.

- Google Maps යෙදුම ඔබගේ දුරකථනයට නැතිනම් play store වෙත ගොස් බාගත කර ගන්න.

</td>
<td>




</td>
</tr>
<tr>
<td>

- ඔබගේ “Location” සහ “Mobile data” සක්‍රිය වී ඇත්දැයි පරීක්ෂා කරන්න.

</td>
<td>




</td>
</tr>
<tr>
<td>

ඔබගේ ස්ථානය ස්ථිර වන තුරු මද වේලාවක් සිටින්න.

“Find my location” යෙදුම තෝරා ඔබගේ ස්ථානය සමීප කර ගන්න. (Zoom)

ඔබ නිවස ඇතුලත සිටිනම් පිටතට ගොස් ඔබගේ ස්ථානය ස්ථිර (Fixed) වනතුරු රැදී සිටින්න.

(ඔබගේ ස්ථානය ස්ථිර වී නොමැති අවස්ථාවේදී විශාල ලා නිල් පැහැති රවුමක් දැකිය හැක)

</td>
<td>




</td>
</tr>
</table>

| | |
|---|---|
| ඔබගේ ස්ථානය නිවරැදිව ස්ථිර වූ පසු මෙවැනි ආකාරයේ රූපයක් දැකිය හැක. |  |
| ඉන්පසු ඔබගේ ස්ථානය මත ඇඟිල්ල මද වේලාවක් තබා සිටින්න. (Touch & hold)<br><br>(පාරවල් මත ඇඟිල්ල නොතබන්න)<br><br>මද වේලාවකින් ඔබගේ ස්ථානීය කණ්ඩාංක රූපයේ පෙන්වා ඇති පරිදි දිස්වෙනු ලබයි. එම කණ්ඩාංකය අයදුම් පතෙහි සටහන් කරගන්න.<br><br>Ex : අක්ෂාංශ (N) :- 7.004004<br><br>දේශාංශ (E) :- 79.955600<br><br>(දශමස්ථාන 6 කට සඳහන් කරන්න) |  |